ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>ඉන්දියාවේ ධීවර කටයුතු සඳහා වෙරළබඩ ඉංජිනේරු මධ්‍යම ආයතනයේ දූත පිරිසක් යෝජිත පේදුරු තුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ.</u>

ඉන්දීය රජයේ ධීවර, පශු සම්පත් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන අමාත්‍යාංශය යටතේ පවතින ධීවර කටයුතු සඳහා වෙරළබඩ ඉංජිනේරු මධ්‍යම ආයතනයේ සිවු සාමාජික දූත පිරිසක් 2025 සැප්තැම්බර් 08-12 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත වූහ. උතුරු පළාතේ යෝජිත පේදුරු තුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික අධ්‍යයනයන් සිදු කිරීම මෙම සංචාරයේ අරමුණ විය.

2. දූත පිරිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා සහ උතුරු පළාත් ආණ්ඩුකාර නාගලිංගම් වේදනායගන් මහතා මෙන්ම ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ උතුරු පළාත් ප්‍රධාන ලේකම්තුමා හමු විය. ඉන්දීය රජයේ මූල්‍යාධාර යටතේ පේදුරු තුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීමට අදාළ කරුණු කාරණා සම්බන්ධයෙන් සාකච්ඡාවන්හිදී අවධානය යොමු විය. දූත පිරිස 2025 සැප්තැම්බර් 09 සහ 10 දෙදින යෝජිත ව්‍යාපෘති භූමිය වෙත තාක්ෂණික සංචාර සිදු කළ අතර ඒ සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ නිලධාරීහු සහ දේශීය පාර්ශ්වකරුවෝ ද එක් වූහ.

3. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ධීවර වරායන් සංවර්ධනය කිරීම සඳහා 2022 මාර්තු මාසයේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ සිදු කරන අතර එය ශ්‍රී ලාංකික ධීවරයන්ගේ ජීවනෝපායන් සහ ප්‍රදේශයේ සංවර්ධනය ඉහළ නංවමින් ධීවර යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වන ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වය පිළිබිඹු කරයි.

***

**කොළඹ**
***2025* සැප්තැම්බර් *12***